# පෙර පාසල් දරුවන්ගේ භාෂා සංවර්ධනය කෙරෙහි පරිසර සාධක කෙසේ ඉවහල් වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(කොළඹ දිස්ත්‍රික්කය ඇසුරෙනි )

ඩබ්. පී. සුනිතා කීර්තිරත්න
ශාස්ත්‍රවේදී උපාධිය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට)

2000/M.Phil/2

UCLIB
538308

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධ වාර්තාව

## සංක්ෂිප්තය

පෙර පාසල් දරුවන්ගේ භාෂා සංවර්ධනය කෙරෙහි, පාරිසරික සාධක කෙසේ ඉවහල් වන්නේද යන්න පිළිබඳ විමර්ශනයක් කිරීම මින් අපේක්ෂිතය.

ළමා අවධිය අතිවිශේෂ සංවේදීතාවක් ඇති යුගයකි. දරුවා හැඟීම්, දර්ශන, ශබ්ද හා පරිසරයේ අන් සියලු අංග පහසුවෙන් උකහා ගන්නා අන්දම විස්මිතය. මුල්ම අවධිවල දී දරුවා භාෂාවේ ප්‍රවීණ වෙයි. මෙම ප්‍රවීණත්වය ලැබීමට දරුවාගේ ආරම්භය හා පරිසරමය සාධක ප්‍රබල කාරක ලෙස ක්‍රියා කරයි. පෙර පාසල් දරුවා සම්බන්ධයෙන් පරිසරමය සාධක ඔහුගේ සංවර්ධනයට බොහෝ සේ බලපායි. දරුවාගේ නිවෙස් හා පවුල් පරිසරය, පෙර පාසල් පරිසරය හා ඔහු ජීවත්වන වටපිටාව අයහපත් වේ නම් එය දරුවාගේ සමස්ත පෞරුෂ වර්ධනයට කේන්ද්‍රීය වන භාෂාව කෙරෙහි සෘජුවම බලපායි. එය පසුකාලීනව විධිමත් පාසලේදී භාෂා විෂයටත්, අනෙකුත් විෂය ප්‍රගුණ කිරීමටත් පසු ජීවිතය කාර්යක්ෂමව ගත කිරීමටත් බාධාවකි. මේ සඳහා භාෂා සංවර්ධනය සඳහා බලපාන පාරිසරික සාධක හඳුනාගෙන වාසිදායක සාධක වැඩිදියුණු කර ගැනීමටත් අවාසිදායක සාධක අවම කර ගැනීමටත් පහත අරමුණු ඔස්සේ අධ්‍යයන පර්යේෂණය මෙහෙයවන ලදී.

1. තෝරාගත් ළමා නියැදිය අයත් පරිසර වර්ගවලට අනුව රැස්කරගත් වාග්මාලාවේ හා වාක්‍යවල විශේෂ ලක්ෂණ අධ්‍යයනය කිරීම.
2. තෝරාගත් පෙර පාසල් ළමා නියැදියේ කථන හැකියාව විවිධ පරිසර වර්ගවලට අනුව වෙනස් වන්නේදැයි පරීක්ෂා කිරීම.
3. පෙර පාසල් දරුවන්ගේ භාෂා සංවර්ධනයට හිතකර හා අහිතකර ලෙස ඉවහල් වී ඇති පරිසර සාධක විමර්ශනය කිරීම.
4. පෙර පාසල් දරුවන්ගේ භාෂා සංවර්ධනයට බලපාන පාරිසරික සාධකවල විෂමකාරී බව අවම කිරීම තුළින් මනා භාෂා සංවර්ධනයක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

උක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික නේවාසික, නාගරික ව්‍යාපාර මිශ්‍ර, තදාසන්න, මුඩුක්කු පැල්පත් හා ග්‍රාමීය යන පරිසර වර්ග 5 ආශ්‍රයෙන් පෙර පාසල් 12 ක අවුරුදු 4 සිට පාසල් යන වයස දක්වා වූ දරුවන් 200 ක් අහඹු නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලදී. ඉන් දරුවන් 50 ක අතුරු නියැදියක් මගින් පර්යේෂකයා විසින් පන්ති කාමරයේදී සහභාගිත්ව නිරීක්ෂණය තුළින් හා දෙමාපියන්ගේ ආධාරයෙන් නිවසේදී කතා කරන වාග්මාලාව හා වාක්‍ය රැස් කරගන්නා ලදී. දරුවන් 200 ගේම භාෂා හැකියාව තක්සේරු කිරීම සඳහා ප්‍රශ්නාවලියක්

ආශ්‍රයෙන් සාධනය පිරික්සන ලදී. මේ තොරතුරු ඇසුරෙන් විවිධ පරිසරවල භාෂාවල වෙනස සංඛ්‍යාන විද්‍යාවෙහි එන එක් පැති විචලතා විශ්ලේෂණය ( One way factor Analysis of Variance) මගින් තහවුරු කෙරිණි. භාෂාවෙහි වෙනස සඳහා බලපාන පාරිසරික සාධක හඳුනාගැනීම සඳහා දෙමාපියන් 50 කට ප්‍රශ්නාවලී දෙන ලද අතර ගුරුවරුන් 20 ක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එසේම පන්ති කාමර ඉගැන්වීම සෘජු නිරීක්ෂණයකට ලක් කරන ලදී. ලබාගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන විධි ක්‍රමය භාවිතයෙන් ප්‍රතිශත, වගු හා ප්‍රස්තාර ආශ්‍රයෙන් විග්‍රහ කරන ලදී.

රැස්කරගත් වාග්මාලාව හා වාක්‍ය විවිධ පරිසර අනුව වෙනස් වන අතර භාෂා හැකියාව ද සාර්ථකත්වයේ සිට නාගරික නේවාසික, තදාසන්න, ග්‍රාමීය, නාගරික ව්‍යාපාර මිශ්‍ර හා මුඩුක්කු පැල්පත් වශයෙන් අනුපිළිවෙළින් පෙළගැස්විය හැකිය. නාගරික ව්‍යාපර මිශ්‍ර හා මුඩුක්කු පැල්පත් පරිසරවල බොහෝවිට උච්චාරණ දෝෂ පැවතිණි. භාෂා සංවර්ධනය සඳහා දෙමාපිය දරු සබඳතාව, දෙමාපිය සමාජ ආර්ථික පසුබිම, නිවසේ අභිප්‍රේරණය, නිවස හා අවට පරිසරය, පෙර පාසල් ගුරුවරයාගේ ගුරු කුසලතාව, පෙර පාසල් ආශ්‍රිත සීමා බාධක හා අවට පරිසරය බලපාන බව නිගමනය කළ හැකි විය.

පෙර පාසල් දරුවන්ගේ දෙමාපිය අධ්‍යාපනය (Parental Education) සඳහා වැඩ සටහන් සැකසීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා මැදිහත්වීම, පෙර පාසල් ගුරුවරයාගේ හා පෙර පාසල් වල යෝග්‍යතාව ඉහළ නංවා ගැනීම සඳහා වන පොදු ප්‍රතිපත්ති මාලාවක් සැකසීම, දැනට සැලසුම් කර ඇති පෙර පාසල් ප්‍රඥප්තිය නීතිගත කොට ක්‍රියාත්මක කිරීම, පිළිගත් අධ්‍යාපන ආයතන මගින් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා විධිමත් නිශ්චිත කාලසීමාවලින් යුතු ප්‍රායෝගික පාඨමාලා ඇති කිරීම, ඉගෙනුම් නව ක්‍රම හා තාක්ෂණ භාවිතය, නවීකරණය කරන ලද ගුණාත්මක පන්ති කාමර සැකසීම ආදිය භාෂා සංවර්ධනය සඳහා ඉවහල් වන යෝජනා වශයෙන් ඉදිරිපත් කරන ලදී.